ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1997 අංක 35 දරන මුදල් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1997 දෙසැම්බර් මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1997 දෙසැම්බර් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 6.75 යි. තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

# 1997 අංක 35 දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1997 දෙසැම්බර් මස 10 වන දින]

එල්.ඩී.–ඕ. 63/96.

## 1963 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1997 අංක 35 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *(ලුහුඬු නාමය.)*

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1963 අංක 11 දරන මුදල් පනතේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :- *(1963 අංක 11 දරන පනතේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

"ගිණුම් විගණනය. 11. රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, මණ්ඩලයේ අරමුදලේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :- *(ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)*

"ජාතික ලොතරැයි. 14 (1) (2) වන උපවගන්තිය යටතේ පවත්වනු ලබන යම් ලොතරැයිවලට අමතරව, සෑම අවුරුද්දක ම නියමිත ලොතරැයි සංඛ්‍යාව මණ්ඩලය විසින් පවත්වනු ලැබිය යුතු ය. ඒ සෑම ලොතරැයියක් ම, නියම කරනු ලබන යම් ආකාරයකට මණ්ඩලය විසින් පවත්වනු ලැබිය යුතු ය.

(2) අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලය හා යම් අමාත්‍යාංශයක්; ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් අතර එකඟ වනු ලැබිය හැකි (වෙනස් කරුණු අතර, යම් ලොතරැයියක දිනා නොගත් ත්‍යාග, එම එකඟවීම යටතේ ඉන් පසුව පවත්වන ලොතරැයිවල ත්‍යාග ප්‍රදානය සඳහා පාවිච්චි කිරීම පිණිස, ත්‍යාග සංචිත ගිණුමකට බැර කිරීම සඳහා විධිවිධාන සලසන නියමයන්

හා, එකඟවීම් යටතේ පවත්වන ලොතරැයිවල දී රජය සන්තක වන ත්‍යාග බෙහෙර කළ යුතු ආකාරය පිළිබඳ නියමයන් ඇතුළුව) නියමයන් මත, මණ්ඩලය විසින් ඒ යම් අමාත්‍යාංශයක්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් සඳහා හෝ වෙනුවෙන් ලොතරැයි පවත්වනු ලැබිය හැකි ය.

(3) මේ පනතේ මේ කොටස යටතේ මණ්ඩලය විසින් පවත්වනු ලබන සෑම ලොතරැයියක් ම, මෙහි මින් මතු "ජාතික ලොතරැයියක්" යනුවෙන් සඳහන් කරනු ලැබේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(1) (අ) 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඇතුළත් වන ලද ගිවිසුමක් යටතේ හැර, අන්‍යාකාරයකින් මණ්ඩලය විසින් පවත්වනු ලබන ජාතික ලොතරැයියකින් ප්‍රදානය කරනු ලබන ත්‍යාග සංඛ්‍යාව සහ ඒ එක් එක් ත්‍යාගයේ වටිනාකම, නියමිත පරිදි විය යුතු ය.

(ආ) 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඇතුළත් වන ලද ගිවිසුමක් යටතේ මණ්ඩලය විසින් පවත්වනු ලබන ලොතරැයියක දී ප්‍රදානය කරනු ලබන ත්‍යාග සංඛ්‍යාව සහ ඒ එක් එක් ත්‍යාගයේ වටිනාකම ඒ ගිවිසුමෙහි සඳහන් පරිදි විය යුතු ය.".

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(3) (අ) 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඇතුළත් වන ලද ගිවිසුමක් යටතේ හැර අන්‍යාකාරයකින් මණ්ඩලය විසින් පවත්වනු ලබන සෑම ජාතික ලොතරැයියක ම ත්‍යාගලාභීන් නියමිත යම් ආකාරයකට නිශ්චය කරනු ලැබිය යුතු ය.

(ආ) 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඇතුළත් වන ලද ගිවිසුමක් යටතේ මණ්ඩලය විසින් පවත්වනු ලබන ජාතික ලොතරැයියක ත්‍යාගලාභීන් ඒ ගිවිසුමෙහි සඳහන් යම් ආකාරයකට නිශ්චය කරනු ලැබිය යුතු ය.".

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(4) මණ්ඩලය විසින් පවත්වනු ලද ජාතික ලොතරැයියක ත්‍යාගලාභීන් නිශ්චය කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන මාස හයක කාලයක් ඉකුත් වීමෙන් පසුව ඒ ජාතික ලොතරැයියේ යම් ත්‍යාගයකට හිමිකම ඇති තැනැත්තා සොයාගත නොහැකි වීම හේතු කොට ගෙන ඒ ප්‍රදානය කර නොමැති යම් ත්‍යාගයක් රාජ්‍ය සන්තක කරනු ලැබිය යුතු අතර, ඒ ත්‍යාගය 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඇතුළත් වන ලද ගිවිසුමක් යටතේ හැර, අන්‍යාකාරයකින් මණ්ඩලය විසින් පවත්වන ලද ජාතික ලොතරැයියක් හා සම්බන්ධ ත්‍යාගයක් සම්බන්ධයෙන් වන්නේ නම්, එය මණ්ඩලයේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය. තව ද ඒ ත්‍යාගය 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඇතුළත් වන ලද ගිවිසුමක් යටතේ පවත්වන ලද ලොතරැයියක් හා සම්බන්ධ ත්‍යාගයක් සම්බන්ධයෙන් වන්නේ නම්, ඒ ගිවිසුමේ නියමයන්ට අනුකූලව ඒ ත්‍යාගය බැහැර කරනු ලැබිය යුතු ය :

එසේ වුවද, ඒ ත්‍යාගය හා සම්බන්ධව කරන ලද යම් හිමිකම් පෑමකින් උද්ගත වූ යම් නඩුවක් හෝ නඩු කටයුත්තක්, ඉහත කී මාස හයක කාලසීමාව ඉකුත්වන විට දී යම් අධිකරණයක් ඉදිරියෙහි විනිශ්චයට භාජනව පවත්නේ නම්, එසේ රාජ්‍ය සන්තක කිරීම කරනු නොලැබිය යුතු අතර, ඒ නඩුව හෝ නඩු කටයුත්ත අවසාන වශයෙන් විනිශ්චය කිරීමේ දී යම් තැනැත්තකු ඒ ත්‍යාගයට හිමිකම් ලබන බවට ප්‍රකාශ කරනු ලැබුවහොත් මණ්ඩලය විසින් ඒ තැනැත්තාට ඒ

ත්‍යාගය ප්‍රදානය කරනු ලැබිය යුතුය : තව ද කිසිම තැනැත්තකු එසේ හිමිකම් ලබන්නේ යයි ප්‍රකාශ කරනු නොලැබුවහොත්, ඒ ත්‍යාගය රාජ්‍ය සන්තක කරනු ලැබිය යුතු අතර, ඒ ත්‍යාගය 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඇතුළත් වන ලද ගිවිසුමක් යටතේ හැර, අත්‍යාකාරයකින් මණ්ඩලය විසින් පවත්වන ලද ජාතික ලොතරැයියක් හා සම්බන්ධ ත්‍යාගයක් වන්නේ නම්, එය මණ්ඩලයේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය : තවද ඒ ත්‍යාගය 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඇතුළත් වන ලද ගිවිසුමක් යටතේ පවත්වන ලද ලොතරැයියක් හා සම්බන්ධ ත්‍යාගයක් වන්නේ නම්, ඒ ගිවිසුමේ නියමයන්ට අනුකූලව ඒ ත්‍යාගය බැහැර කරනු ලැබිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉකිබිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :-

"(1අ) 14 වන වගන්තියේ (2) උපවගන්තිය යටතේ ඇතුළත් වන ලද ගිවිසුමක් යටතේ හැර අත්‍යාකාරයකින් මණ්ඩලය විසින් පවත්වන ලද ජාතික ලොතරැයියක, මුදලින් සමන්විත ත්‍යාගයක් කිසිම තැනැත්තකු විසින් දිනාගනු නොලැබූ අවස්ථාවක, මේ වගන්තියේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඒ ත්‍යාග මුදල ත්‍යාග සංචිත ගිණුමකට බැර කරනු ලැබිය යුතු අතර, ඒ ගිණුමේ එකතුවන මුදල්, 14 වන වගන්තියේ (2) උපවගන්තිය යටතේ ඇතුළත් වන ලද ගිවිසුමක් යටතේ හැර අත්‍යාකාරයකින් මණ්ඩලය විසින්, ඉන් පසුව පවත්වනු ලබන ජාතික ලොතරැයිවල ත්‍යාග ප්‍රදානය සඳහා ප්‍රයෝජනයට ගනු ලැබිය යුතු ය.".

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ :-

(අ) "ස්ථිර ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන" යන වචන වෙනුවට "අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන" යන වචන ආදේශ කිරීමෙන් :

(ආ) "සෑම ජාතික ලොතරැයියකින් ම ලැබෙන මුදලින්" යන වචන වෙනුවට "මණ්ඩලය විසින් 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ හැර අන්‍යාකාරයකින් පවත්වනු ලබන සෑම ජාතික ලොතරැයියකින් ම ලැබෙන මුදලින්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

(3) ඒ වගන්තිය අගට පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් :–

"(3) මණ්ඩලය විසින් 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ගිවිසුමකට ඇතුළත් වී සිටින, අවස්ථාවෝචිත පරිදි, යම් අමාත්‍යාංශයක්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් සඳහා ඒ ගිවිසුම යටතේ මණ්ඩලය විසින් පවත්වන ලද සෑම ජාතික ලොතරැයියකින් ම ලැබෙන මුදල්, ඒ ජාතික ලොතරැයියේ ප්‍රදානය කරන ලද ත්‍යාගවල වටිනාකම සහ ඒ ගිවිසුමේ නියම යටතේ ඒ ජාතික ලොතරැයිය පැවැත්වීම සඳහා මණ්ඩලයට ගෙවිය යුතු ගාස්තු කිසිවක් අඩුකර ගැනීමෙන් පසුව ඒ අමාත්‍යාංශයට, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවට, හෝ රාජ්‍ය සංස්ථාවට මණ්ඩලය විසින් ඒකාබද්ධ අරමුදල මඟින් ගෙවනු ලැබිය යුතු ය.

(4) 16 වන වගන්තිය යටතේ රාජ්‍ය සන්තක කරනු ලදුව මණ්ඩලයේ අරමුදලට ගෙවන ලද, 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඇතුළත් වන ලද ගිවිසුමක් යටතේ හැර අන්‍යාකාරයකින් මණ්ඩලය විසින් පවත්වන ලද ජාතික ලොතරැයියක සියලු ත්‍යාග මුදල්, මණ්ඩලය විසින් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය ඉවත් කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :–

"ලොතරැයි ආදායම අදාළ වීම.

19. මණ්ඩලය විසින් මේ පනතේ මේ කොටස යටතේ පවත්වනු ලබන කිසිදු ජාතික ලොතරැයියකට හෝ ලොතරැයියක් සම්බන්ධයෙන්, ලොතරැයි ආදායම අදාළ නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ යෙදෙන "සෑම ජාතික ලොතරැයියක ම ටිකට්පත් විකිණිය යුතු මිල ;" යන වචන වෙනුවට "මණ්ඩලය විසින්, 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඇතුළත් වන ලද ගිවිසුමක් යටතේ හැර අන්‍යාකාරයකින්, පවත්වනු ලබන සෑම ජාතික ලොතරැයියක ම ටිකට්පත් විකිණිය යුතු මිල ;" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) "මුදල් වර්ෂය" යන්නෙහි අර්ථ කථනය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :-

"මුදල් වර්ෂය" යන්නෙන්, කවර හෝ වර්ෂයක ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව අදහස් වේ.";

(2) "අමාත්‍යවරයා" යන්නෙහි අර්ථ කථනය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :-

"අමාත්‍යවරයා" යන්නෙන්, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ.";

(3) ඒ වගන්තිය අගට පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :-

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ හැර වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද,

ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින්, මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ.".

**10.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.